සුභ සාධක සංගමය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය හොරණ
WELFARE SOCIETY DIVISIONAL SECRETARIAT HORANA

# හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය සුභ සාධක සංගමයේ ආපන ශාලාව සඳහා මිල ගණන් කැඳවීම

උක්ත ආපන ශාලාව සඳහා පහත සඳහන් කොන්දේසි යටතේ මිල ගණන් කැඳවනු ලබන අතර ටෙන්ඩර් බාරගන්නා අවසාන දිනය 2024 මාර්තු 07 දින පස්වරු 1.00 වේ.

02. ටෙන්ඩර් පෝරම රුපියල් 100.00ක් ගෙවා සමිතියේ ලේකම්/ භාණ්ඩාගාරික ගෙන් ලබාගතයුතු අතර සුදුසු ටෙන්ඩර්කරුවෙක් තෝරාගැනීමේ බලය සුභ සාධක සංගමය සතුය. තෝරාගත් ටෙන්ඩර්කරු රු.10,000/=ක ඇප මුදලක් තැන්පත් කළ යුතු අතර ගිවිසුම්ගත කාල සීමාව අවසන්වීමට පෙර ආපනශාලාව ලබාගත් ටෙන්ඩර්කරුගේ අභිමතය පරිදි ඉවත්කර ගැනීමට කටයුතු කරනු ලැබුවහොත් රු 10,000/= ක ඇප මුදල ආපසු ලබාදෙනු නොලැබේ.

03. දේශීය ආහාර පාන සඳහා ප්‍රමුඛතාවය ලබදිය යුතු අතර දිවා ආහාර (බත් පාර්සල්) මිලදීගැනීමේ පහසුකම තිබිය යුතුය. නිරෝධායන නීතිරීති වලට අනුකූලව හා පිරිසිදු භාවය උපරිම වශයෙන් පවත්වාගැනීමට කටයුතු කලයුතු අතර ආහාර වර්ග ආවරණ සහිතව (පාර්සල් වශයෙන්) අලෙවි කිරීමට කටයුතු කළ යුතුය. ***පහත සඳහන් ආහාර පාන වර්ගද ඇතුලුව අලෙවිය සඳහා ඉදිරිපත් කරන අනෙකුත් ආහාර පාන වර්ග වල උපරිම සිල්ලර මිල ගණන් ඇතුලත් ලේඛනයක් සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝරමය සමඟ ඉදිරිපත් කල යුතුය.***

- තේ එකක්
- කහට තේ එකක් හකුරු සමඟ
- එළවළු බත් පාර්සල් එකක්
- මාළු හෝ මස් සමඟ බත් පාර්සල් එකක්
- බිත්තර සමඟ බත් පාර්සල් එකක්
- කිරි බත්
- ඉදි ආප්ප
- පිට්ටු
- රොටී
- හැලප
- වන්ඩු
- අල වර්ග
- ධාන්‍ය වර්ග
- කැඳ වර්ග

04. තෝරාගත් ටෙන්ඩර්කරු සුභ සාධක සංගමය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය.

05. ආපන ශාලාව තුල ඉතිරිවන අපද්‍රව්‍ය බැහැර කිරීමේ වගකීම ආපනශාලා භාරකරු විසින් දැරිය යුතුය.

06. ආපනශාලාව තුල මත්පැන් හා දුම්වැටි අලෙවිය හා පිටතින් රැගෙන විත් මෙම පරිශ්‍රය තුල මත්පැන් හා දුම්වැටි භාවිතය සපුරා තහනම් වන අතර ආපනශාලා භාරකරු විසින් එවැනි තත්ත්වයන් ඇති නොවීමට වගබලාගත යුතුය.

මිල ගණන් සුභ සාධක සංගමය මගින් සපයන ටෙන්ඩර් පෝරමයේ සඳහන් කර කවරයක බහා සීල් කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලීම මගින් හෝ ලියාපදිංචි තැපෑලෙන් ගරු **සභාපති, හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය සුභ සාධක සංගමය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හොරණ** යන ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙලවරේ '' හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ආපන ශාලාව සඳහා මිල ගණන් කැඳවීම'' යනුවෙන් සඳහන් කළ යුතුය.

කේ.ඩී.එස්. සජීවනා
ගරු සභාපති / ප්‍රාදේශීය ලේකම්
හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයීය සුභ සාධක සංගමය
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
හොරණ

කේ. ඩී. එස්. සජීවනා
ප්‍රාදේශීය ලේකම්
හොරණ.